# ඉතිහාසය

## 13 ශ්‍රේණිය



## 13.1 දහසය වැනි සියවසේ සිට දහ අට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව

දර්ශනපති
එෂාන් ඉමල්ක විජයරත්න

ගුරුගෙදර - උසස් පෙළ ඉතිහාසය
ජාතික අධ්‍යාපන ආයතනය

# දෙවන රාජසිංහ රජු (ක්‍රි.ව.1635 - 1687)

- සෙනරත් රජුගේ ඇවෑමෙන් ඔහුගේ පුත් මහා අස්ථාන කුමරු දෙවන රාජසිංහ නමින් උඩරට රජවීම
- පෘතුගීසීන්ගෙන් උඩරටට එල්ල වන ප්‍රහාර මැඩ පැවැත්වීම හා පෘතුගීසි විරෝධී පාලකයෙකු වීම
- රජු පැතුගීසීන් නෙරපා දැමීම සඳහා 1637 දී විලියම් ජැකොබ්ස් කොස්ටර් නම් ලන්දේසි ජාතිකයා සමඟ සබඳතා ඇති කර ගැනීම



දෙවන රාජසිංහ රජු

- දෙවන රාජසිංහ රජු පෘතුගීසීන් නෙරපා දැමීම සඳහා ලන්දේසි උපකාර ඉල්ලා බතාවියට හසුන්පත් යැවීම නිසා අද්මිරාල් වෙස්ටර් වෝල්ඩ් නැව් හමුදාවක් රැගෙන ලංකාවට පැමිණීම

- රජු 15000 ක සේනාවක් සමඟ මඩකලපුව ආසන්නයේ කඳවුරු බැඳීම

- ලන්දේසීන් මඩකලපුව පෘතුගීසි බලකොටුවට පහර දී එය යටත් වූ පසු දෙවන රාජසිංහ රජුට ලබාදීම

- පෘතුගීසි කපිතාන් ජනරාල් දියෝගු ද මේලෝද කස්ත්‍රෝ 1638 දී උඩරටට කළ ආක්‍රමණය ගන්නෝරුවේ දී පරාජය කිරීමට දෙවන රාජසිංහ රජු සමත් වීම

- 1638 දී දෙවන රාජසිංහ රජු ලන්දේසීන් සමඟ ගිවිසුමකට එළඹීම

- වගන්ති 19 කින් යුත් ගිවිසුමට උඩරට වෙනුවෙන් දෙවන රාජසිංහ රජු ද ලන්දේසීන් වෙනුවෙන් වෙස්ටර්වෝල්ඩ් හා විලියම් ජැකොබ්ස් කොස්ටර් අත්සන් තැබීම

- 1638 උඩරට ලන්දේසි ගිවිසුමේ මූලික කරුණු
    1. පෘතුගීසීන් මෙරටින් පලවා හැරීමට උඩරට රජුට සහය ලබාදීමට ලන්දේසීන් එකඟ වීම
    2. ලන්දේසීන්ට වැයවන මුදල් වෙළෙඳ ද්‍රව්‍ය (කුරුඳු, ගම්මිරිස්, මී ඉටි ආදිය) මගින් ගෙවීමට රජු එකඟ වීම
    3. ඇතුන් හැර උඩරට සෙසු වෙළෙඳ ද්‍රව්‍ය පිළිබඳ ඒකාධිකාරය ලන්දේසීන්ට ලැබීම
    4. පෘතුගීසීන්ගෙන් අල්ලා ගන්නා ලද බලකොටුවල රජු කැමති නම් ලන්දේසි හමුදාව නතර කරවීමට එකඟ වීම

- රජුට දුන් පිටපතේ හා ලන්දේසීන් සතු පිටපතේ පරස්පරතාවක් ඇතිබව රජුට අවබෝධ වීම

- රජුගේ පිටපත
- පෘතුගීසින්ගෙන් අල්ලා ගන්නා බලකොටුවල ආරක්ෂාව සඳහා රජු කැමති නම් පමණක් ලන්දේසි සෙබළුන් රැදවිය හැකි ය.

- ලන්දේසි පිටපත

  පෘතුගීසින්ගෙන් අල්ලා ගන්නා ලද බලකොටුවල ආරක්ෂාව සඳහා ලන්දේසි සෙබළුන් රැදවිය හැකිය.

# ක්‍රි.ව. 1638 සිට 1658 දක්වා දෙවන රාජසිංහ රජු ලන්දේසීන්ගේ ආධාර මත පෘතුගීසි බලකොටු අල්ලා ගැනීම

| | | |
|---|---|---|
| 1639 | - | ත්‍රිකුණාමලය |
| 1640 | - | මීගමුව, ගාල්ල |
| 1652 | - | කළුතර අගුරුවාතොට |
| 1656 | - | කොළඹ කොටුව |
| 1658 | - | මන්නාරම, යාපනය |

- 1642 දී පෘතුගාලය හා ඕලන්දය අතර යුරෝපයේ දස අවුරුදු සාම ගිවිසුමක් ඇතිවීම හා ලංකාවේ පෘතුගීසි ලන්දේසි ගැටුම නතර වීම
- උඩරට හා ලන්දේසීන් අතර සබඳතා වැළැක්වීමට පෘතුගීසීන් 1634 දී අට්ටාපිටිය ගිවිසුම ඇති කර ගත්ත ද එය අසාර්ථක වීම
- ක්‍රි.ව. 1664 දී රජුට එරෙහිව ඇති වූ නිල්ලඹ කැරැල්ලට මුහුණ දීමට සිදුවීම

- වාර්ෂික දළදා පෙරහැර නතර කිරීම ආදිය මත අඹන්වෙල රාළ නමැත්තා රජුගේ නිල්ලඹ මාලිගාවේදී රජු ඝාතනය කිරීමට තැත් කළ ද එය අසාර්ථක වීම
- 1658 දී පෘතුගීසීන් නෙරපා දැමුව ද ලන්දේසීන් පෘතුගීසි බල ප්‍රදේශයන්හි බලය පිහිටුවීම
- 1665 සිට 1668 අතර ලන්දේසීන් උඩරට ප්‍රදේශ කීපයක් අල්ලා ගැනීම

- 1670 සිට 1675 අතර රජු ලන්දේසීන්ට පහර දී ඔවුන් සතු ප්‍රදේශ රැසක් අත්පත් කර ගැනීම

- දකුණු ඉන්දියාවේ මදුරාපුරයේ කුමාරිකාවක් විවාහ කර ගැනීමේ ප්‍රතිපත්තිය ආරම්භ කිරීම

- 

- මෙකල රොබට් නොක්ස් උඩරට රාජධානියේ සිරකරුවෙකු ලෙස ගත කිරීම

# දෙවන විමලධර්මසූරිය රජු (ක්‍රි.ව. 1687 - 1707)

- දෙවන රාජසිංහ රජුගේ පුත්‍රයා වූ මොහු සාමකාමී පාලකයෙකු වීම
- රජු කාර්යක්ෂම පාලකයෙකු නොවු නිසා මෙකල උඩරට රදළ ප්‍රධානීන් බලය වර්ධනය කර ගැනීම
- උඩරට රජු මුළු මහත් දෙරණෝහිම රජු සේ සැලකෙන පරිදි සිය පදවිය දැරීම

- පිරිහී තිබූ උපසම්පදාව පිහිටුවීමට පහළ බුරුමයෙන් භික්ෂූන් වැඩම කරවීම ලන්දේසීන් වෙත පැවරීම
- දළදා මාලිගය තෙමහල් ප්‍රාසාදයක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීම
- දෙවෙනි රාජසිංහ රජු ව්‍යාප්ත කර තිබූ මහනුවර රාජ්‍යයට අයත් ප්‍රදේශ එලෙසින් ම රැක ගැනීම

# ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු (ක්‍රි.ව. 1707 - 1739)

- මහනුවර කිරුළට හිමිකම් කියූ අවසන් සිංහල රජු ය
- 
- දෙවන විමලධර්මසූරිය රජුගේ පුත්‍රයා ය
- පරිපාලන කටයුතුවල දුර්වලතාව නිසා ප්‍රභූ බලය තවදුරටත් වර්ධනය වීම
- මදුරාවෙන් වඩුග කුමාරියක් සරණ පාවා ගැනීම නිසා මහනුවර රාජධානිය නායක්කර්වරු අතට පත්වීම

- කෙලිලොල් යෞවන ජීවිතයක් ගත කළ නිසා සිංහලයන් ඔහුව සෙල්ලම් නිරිඳු ලෙස හැඳින්වීම

- 1709 දී රජුට විරුද්ධව කැරැල්ලක් ඇතිවීම කිරිවවුලේ රාළ, යාලේගොඩ මහාධිකාරම් හා ඒදණ්ඩාවේරාළ ආදීන් මහමළුවේ ඇත් පොරයක් සංවිධානය කර රජු මරා පට්ටිය බණ්ඩාර නැමැත්තෙකු රජ කරවීමට උත්සාහ දැරීම

- 1739 දී තුරුණු වියේදීම නරේන්ද්‍රසිංහ රජුගේ අභාවය සිදුවීමත් මදුරා මෙහෙසියන් කෙරෙන් දරුවන් නොසිටි බැවින් නායක්කර් වංශික සම්ප්‍රදාය අනුව බිසවගේ සොහොයුරා රාජ්‍යත්වයට පත්වීම

# නායක්කර් රජ පෙළපත

- නායක්කර් වංශිකයන් ලෙසත්, වඩුගයන් ලෙසත් හැඳින්වෙන මොවුන්ගේ බලයේ කේන්ද්‍රය දකුණු ඉන්දියාවේ මදුරාපුරය වීම
- උඩරට පළමු වන විමලධර්මසූරිය, සෙනරත්, දෙවැනි රාජසිංහ යන පාලකවරු පෘතුගීසීන්ට විරුද්ධව වඩුගයන්ගේ සහය පතා තිබීම
- ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු මදුරාවෙන් වඩුග කුමරියක් සරණ පාවා ගැනීම නිසා මහනුවර රාජධානිය නායක්කර්වරුන් අතට පත්වීම

# ශ්‍රී විජය රාජසිංහ රජු (ක්‍රි.ව. 1739 - 1747)

- නායක්කර් රාජවංශයේ ආරම්භක පාලකයා වීම
- බුදුදහම වැළඳගෙන දිගුකලක් භික්ෂූන් ඇසුරේ හැදී වැඩුණු රජු රාජ්‍යත්වයෙන් පසුව සැදැහැවත් බෞද්ධයෙකු ලෙස බුද්ධාගමේ දියුණුවට කටයුතු කිරීම
- වැලිවිට සරණංකර හිමියන් යටතේ අධ්‍යාපනය ලැබීම
- ශ්‍රී විජය රාජසිංහ රජු නරේනප්පාගේ දියණියක වූ මදුරාවේ නායක්කර් වංශික කුමාරිකාවක විවාහ කර ගැනීම


- රජුගේ නායක්කර් ඥාතීන් උදෙසා කුමාරුප්පේ හෙවත් මලබාර් වීදිය නමින් වීදියක් වෙන් කිරීම
- වැලිවිට සරණංකර හිමියන්ගේ දායකත්වයෙන් සිල්වත් සමාගම හෙවත් වැලිවිට සමාගම ආරම්භ වීම
- වැලිවිට සරණංකර හිමියන්ගේ උපදෙස් පරිදි රජු උපසම්පදාලාභී භික්ෂූන් වැඩම කරවීමට ලන්දේසීන්ගෙන් නැවක් ලබා ගැනීම
- බුරුමයෙන් උපසම්පදාව රැගෙන ඒමට 1741 දී හා 1747 දී කළ දූත ගමන් දෙකම අසාර්ථක වීම

# කීර්ති ශ්‍රී රාජසිංහ (ක්‍රි.ව. 1747 - 1782)

- නායක්කර් රාජවංශයට අයත් උඩරට දෙවන පාලකයා වීම
- ශ්‍රී විජය රාජසිංහ රජුගේ ඇවෑමෙන් ඔහුගේ මදුරා දේවියගේ සොහොයුරා කිර්ති ශ්‍රී රාජසිංහ නමින් ඔටුනු පැළඳීම
- නාඩුකාට්ටු සාමි නායක්කර්ගේ දියණිය සරණ පාවා ගැනිම
- වයස අවුරුදු 16 තරම් ලාබාල වියේ දී බලයට පත්වීම නිසා රජුගේ පියා වූ නරේනප්පා නායක්කර් පාලන කටයුතු මෙහෙයවීම

- "සිංහලයන්ගේ රජු බෞද්ධයෙකු විය යුතු යැයි" පැවති ජන සම්මතය අගය කළ රජු ආගමට උද්‍යෝගිමත් ලෙස කැප වීම
- පරිහානියට පත්ව තිබූ බුදුදහම නගා සිටුවීමට වැලිවිට සරණංකර හිමියන්ගේ උපදෙස් පරිදි පෝය මළුව, අස්ගිරිය, සුදුහුම්පොළ, අම්පිටිය, තිත්තවෙල හා ගංගාරාමය යන ස්ථානවල ඉගෙනුම් පහසුකම් ඇති කිරීම
- උපසම්පදාව යළි පිහිටුවීමට වැලිවිට සරණංකර හිමියන්ගේ උපදෙස් පරිදි විල්බාගෙදර මුහන්දිරම් ප්‍රමුඛ තානාපතිවරු පිරිසක් සියම් දේශයට (තායිලන්තය) යැවීම

- සියමේ බොරොම්කොට් රජු සියම් දූතයන් පස් දෙනෙකු සමඟ උපාලි තෙරුන් වහන්සේ 1753 දී ලංකාවට වැඩම කරවා යළි උපසම්පදාව පිහිටුවීමෙන් ශ්‍යාමෝපාලී හෙවත් සියම් නිකාය ආරම්භ වීම
- දිවයිනේ පෞරාණික බෞද්ධ සිද්ධස්ථානවල පරිපාලනය මල්වතු - අස්ගිරි උභය විහාරයන්ට පැවරීම
- සියම් නිකාය, මල්වතු හා අස්ගිරි යනුවෙන් මධ්‍යස්ථාන දෙකකින් යුක්තව පිළිගැනීම
- එතෙක් පැවති සතර දේවාල පෙරහැරට දළදා පෙරහැර එක් කිරීමෙන් මහනුවර වාර්ෂික ඇසළ සැණකෙළිය වර්ණවත් කිරීම




දළදා පෙරහැර - 1819 දී

- ශ්‍රී පාදස්ථානය නැවතත් බෞද්ධ භික්ෂූන් වහන්සේට පවරා දීම
- මුල්කිරිගල විහාරයේ චිත්‍ර නිර්මාණය වීම හා කැලණි විහාරය ප්‍රතිසංස්කරණය කිරීම
- උඩරටින් ඇති වූ සාහිත්‍ය ප්‍රබෝධය දකුණුලක කරා ද ගමන් කිරීම නිසා මාතර සාහිත්‍ය සම්ප්‍රදාය ආරම්භ වීම
- කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස ලන්දේසීන් හා උඩරැටියන් අතර 1760 සිට සටන් මාලාවක් ඇතිවීම
- මහනුවර අල්ලා ගැනීමට ලන්දේසීන් දෙවරක් ම දැරූ උත්සාහය ව්‍යාර්ථ වීම



පෝයමළු විහාරය



අස්ගිරිය අදාහන මළුව

- ලන්දේසීන් ලංකාවෙන් නෙරපා දැමීමට රජු බ්‍රිතාන්‍ය ආධාර ඉල්ලා සිටීම නිසා 1762 දී ජෝන් ෆයිබස් නම් බ්‍රිතාන්‍ය දූතයා උඩරට සමඟ කළ දූත ගමන අසාර්ථක වීම
- ඇතැම් උඩරට ප්‍රධානීන් රජුට විරෝදය පෑම නිසා 1760 දී රදලයන් රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක් ඇති කිරීම හා රජු එය පරාජය කිරීම
- ක්‍රි.ව. 1765 දී ලන්දේසීන් උඩරටට ආක්‍රමණයක් මෙහෙයවීම සහ ලන්දේසීන් හා උඩරට කීර්ති ශ්‍රී රාජසිංහ රජු අතර ඇති වූ ගැටුමින් රජු ජය ලැබීම

- කීර්ති ශ්‍රී රාජසිංහ රජු හා ලන්දේසී ආණ්ඩුකාර විලේම් ෆැලක් අතර අත්සන් කළ අවාසිදායක ගිවිසුමකට එකඟ වීමට රජුට සිදුවීම

- ක්‍රි.ව. 1766 ගිවිසුම වෙනස් කරගැනීමට රජු උත්සාහ දැරීම

- සසුනේ පැවැත්ම උදෙසා කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත නමින් භික්ෂු ආකල්ප සංවර්ධනය උදෙසා ව්‍යවස්ථා මාලාවක් ඇති කිරීම



අදාහන මළුව ගෙඩිගේ

# රාජාධි රාජසිංහ රජු (ක්‍රි.ව. 1782 - 1798)

- කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ සහෝදරයා රාජාධි රාජසිංහ නමින් රාජ්‍යත්වයට පත්වීම
- උඩරට රාජ සභාව තුළ ඇති වූ පිල් බෙදීම නිසා උඩරට ප්‍රභූවරුන් හා නායක්කර්වරුන් අතර මතභේද උග්‍රවීම
- උඩරට රාජ්‍යයේ පරිපාලන කටයුතු දුර්වල වීම
- ලන්දේසීන් පලවා හැරීමට බ්‍රිතාන්‍යයන් කෙරෙහි විශ්වාසය නොතැබූ රජු ප්‍රංශ ජාතිකයන්ගෙන් උපකාර අපේක්ෂා කිරීම
- ක්‍රි.ව. 1782 දී හියුබොයිඩ් උඩරටට යවා මදුරාසි ආණ්ඩුව පවත්වන ලද සාකච්ඡා අසාර්ථක වීම

- ක්‍රි.ව. 1795 දී රොබට් ඇන්ඩෲස් නම් මදුරාසි ආණ්ඩුවේ නිලධාරියා උඩරට රාජ්‍ය සමඟ දූත ගමනක යෙදීම
- 1789 ප්‍රංශ විප්ලවයෙන් පසු ප්‍රංශ සමූහාණ්ඩුව ඕලන්දය ආක්‍රමණය කර එහි "බතාවියානු සමූහාණ්ඩුව" පිහිටුවීම
- මෙම ආක්‍රමණයේදී ඕලන්ද පාලක විලියම් කුමරු ආරක්ෂාව පතා එංගලන්තයට පලා යාම
- ලංකාවේ ලන්දේසීන් සතු ප්‍රදේශ ප්‍රංශ ජාතිකයන්ගෙන් ආරක්ෂා කරගැනීමට එම ප්‍රදේශ බ්‍රිතාන්‍යයන්ට ලබාදෙන මෙන් එංගලන්තයේ කිව් මාලිගයේ රැකවරණ ලබමින් සිටි විලියම් කුමරුගෙන් බ්‍රිතාන්‍යයන් ඉල්ලා සිටීම

- ලංකාවේ ලන්දේසීන් සතු මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍යයන්ට ලබාදෙන ලෙස විලියම් කුමරු ලංකාවේ ලන්දේසි ආණ්ඩුකාර වූ ෆන් ඇංගල්බෙක් වෙත කිව් ලිපිය එවීම
- ලන්දේසි ආණ්ඩුකරු ඊට එකඟ නොවීම නිසා බ්‍රිතාන්‍යයෝ ලංකාවේ ලන්දේසි ප්‍රදේශවලට පහරදීම
- යාපනය, මන්නාරම, කල්පිටිය, ගාල්ල යන ප්‍රදේශ පිළිවෙළින් අල්ලා ගනිමින් 1776 වන විට ලන්දේසීන් සතු ප්‍රදේශ බ්‍රිතාන්‍යයන් අල්ලා ගැනීම



ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

# ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (ක්‍රි.ව. 1798 - 1815)

- රාජාධි රාජසිංහ රජුට දරුවන් නොසිටීම හා මිය ගිය රජුගේ මෙහෙසියන් තිදෙනාට මුත්තුසාමි නම් සොහොයුරෙක් සිටීම
- රජුගේ දුර නෑයෙකු ද නායක්කර් වංශිකයෙකු ද වූ කන්නසාමි කුමරු උඩරට සිංහාසනයට හිමිකරුවා ලෙස පිළිමතලව්වේ මහ අදිකාරම් විසින් පත් කිරීම
- කන්නසාමි ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් අභිෂේක ලැබීම

- රජු නායක්කර් ප්‍රධානීන්ගේ උපදෙස් අනුව ක්‍රියා කිරීම
- එබැවින් රජු හා රදල ප්‍රධානීන් අතර සබඳතා බිඳ වැටීම
- ක්‍රි.ව. 1800 දී ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා විසින් මැක්ඩෝවල් සහ බාබට් සෙනෙවියන් යටතේ උඩරටට ආක්‍රමණයකට සමාන දූත ගමනක යෙදී ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සමඟ ගිවිසුමකට එළඹීමට උත්සාහ ගැනීම
- ක්‍රි.ව.1803 දී ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකරු මැක්ඩෝවල් සෙනෙවියා යටතේ උඩරට ආක්‍රමණය කිරීම

- උඩරැටියන්ගේ සහය මත ශ්‍රී වික්‍රම රාජසිංහ රජු බ්‍රිතාන්‍යයන්ගේ ආක්‍රමණය පරාජය කිරීම
- ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අවසන් කාලයේදී සිදු කළ පහත ක්‍රියාමාර්ග නිසා ජනතා සහය හා රටවැසියන්ගේ රාජපාක්ෂිකභාවය අහිමි වීම
    - රජු ඝාතනය කිරීමට කුමන්ත්‍රණය කළ බවට චෝදනා කොට පිළිමතලව්වේගේ හිස ගසා දැමීම
    - ඇහැලේපොළ පවුලේ සාමාජිකයන්ට දරුණු දඬුවම් පමුණුවා ඔවුන් විනාශ කර දැමීම

- දළදා මැදුර ඉදිරිපිට දේවසංහිඳ නම් ස්ථානය දණ්ඩන භූමියක් ලෙස යොදා ගැනීම
- රජුගේ මතයන්ට එරෙහි වූ භික්ෂූන් රදල ප්‍රධානීන් හා සාමාන්‍ය ජනතාවට දඬුවම් පැමිණිවීම

- තෝමස් මේට්ලන්ඩ් හා රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරුන්ගේ මග පෙන්වීම යටතේ ජෝන් ඩොයිලි විසින් උඩරට රදල ප්‍රධානීන් හා සියලු සමාජීය ජනයා සමඟ සබදතා ඇති කර ගැනීම

- උඩරට තුළ බ්‍රිතාන්‍ය චරපුරුෂ සේවා ඇතිකොට යුධ ශක්තිය, උඩරට මාර්ග ආදිය හඳුනා ගැනීම හා ඩොයිලිගේ පෙළඹවීමෙන් රජු මත්පැනට ලොල් වීම
- දන්ත ධාතු මන්දිරයට රජු රමණීය පත්තිරුප්පුවක් එක් කිරීම
- දළදා මැදුර අබියස කිරිමුහුද නමින් වැවක් තැනීම
- නාථ - විෂ්ණු - කතරගම - පත්තිනි සිවු දේවාල පේරාදෙණියට ගෙනයාම

- ජෝන් ඩොයිලි හා මිතුරු වූ ඇහැලේපොළ 1814 දී රජයට විරුද්ධ කැරැල්ලක් මෙහෙයවීම

- 1815 දී බ්‍රිතාන්‍යයන් රජුට එරෙහිව යුද්ධ ප්‍රකාශ කිරීම

- ඇහැලේපොළගේ මෙහෙයවීම මත බ්‍රිතාන්‍ය බල ඇණි උඩරට ආක්‍රමණය කිරීමේ දී මොල්ලිගොඩ මහ අදිකාරම්ගේ ද සහය ලැබීම

- ජනතා සහය නොලද රජු සිය මෙහෙසියන් අතවැස්සන් සමඟ දුම්බරට පලා යාම

- මැද මහනුවර දී බ්‍රිතාන්‍යයන් රජු අත් අඩංගුවට ගැනීම

- 1815 මහනුවර මගුල් මඩුවේදී ඉංග්‍රීසි ආණ්ඩුව වෙනුවෙන් බ්‍රවුන්ගේ ආණ්ඩුකාරවරයා හා උඩරට වෙනුවෙන් අදාල ප්‍රධානීන් අතර උඩරට රාජධානිය යටත් වීම සම්බන්ධ උඩරට ගිවිසුම අත්සන් තැබීම

- ඉංග්‍රීසි අත් අඩංගුවේ සිටි ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ප්‍රථමයෙන් කොළඹ කොටුවට ද, අනතුරුව ඉන්දියාවේ වෙල්ලෝරයට ද පිටු වහල් කිරීම

# සාරාංශය

- දෙවන රාජසිංහ රාජ්‍ය සමයේ සිට ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රාජ්‍ය සමය දක්වා ඉතිහාසය
- නායක්කර් රාජ වංශය